# ප්‍රසම්පාදන දැන්වීමයි.
# වීරකැටිය ප්‍රාදේශීය සභාව

ජලභීතිකා රෝගය තුරන් කිරීමේ අරමුණින් වීරකැටිය ප්‍රාදේශීය සභාව මගින් සුනඛයින් වන්ධ්‍යාකරණය කිරීමේ වැඩසටහනක් සංවිධානය කර ඇත.

**<u>පොදු නියමයන් හා කොන්දේසි</u>**

- පිළිගත් දේශීය හෝ විදේශීය විශ්ව විද්‍යාලයකින් පශු වෛද්‍ය උපාධිය ලබා ගත් උපාධි සහතිකයේ පිටපතක්, ශ්‍රී ලංකා පශු වෛද්‍ය සභාවේ ලියාපදිංචි සහතිකයෙහි පිටපතක් සහ මෙම විෂය පථයට අදාල වෙනත් සුදුසුකම් සම්බන්ධ ලිපි ලේඛන වල පිටපත් මිල ගණන් ඉදිරිපත් කිරීමේ දී ඉදිරිපත් කළ යුතුය.
- සුනඛ වන්ධ්‍යාකරණට අදාලව ඔබ විසින් අල්ලා ගන්නා සුනඛකයින් වන්ධ්‍යාකරණ ස්ථානයට ප්‍රවාහනය කර දීම හා වන්ධ්‍යාකරණයෙන් පසු නැවත එම ස්ථාන කරා සුනඛකයින් ප්‍රවාහනය කර දීම, වන්ධ්‍යාකරණයට අදාල ස්ථානය ලබා දීම හා මේ සම්බන්ධයෙන් බල ප්‍රදේශයේ ප්‍රචාරණ කටයුතු සිදු කිරීම ප්‍රාදේශීය සභාව මගින් සිදු කරනු ලැබේ.
- මෙහිදී සුනඛයින් අල්ලා ගැනීමට සේවකයින් සහ ආරක්ෂිත කූඩු ඔබ විසින් සපයා ගත යුතුය.

**<u>ලංසු ඉදිරිපත් කිරීම:</u>**

- සෑම ලංසුකරුවෙකු විසින්ම සකස් කරන ලද ආකෘතියක් මගින් මිල ගණන් ඉදිරිපත් කළ යුතුය.
- සෑම ලංසුවක්ම අනු පිටපතක් සහිතව ඉදිරිපත් කළ යුතු අතර ඒවා වෙන වෙනම ලංසුකරු විසින අත්සන් කර තිබිය යුතුය.
- ලංසුවේ මුල් පිටපත හා අනු පිටපත වෙන වෙනම ලියුම්කවර වල බහා මුල් පිටපත හා අනු පිටපත යනුවෙන් අදාල කවරයේ සඳහන් කර, ඒවා යළිත් එක් කවරයක බහා මුද්‍රා තැබීමෙන් අනතුරුව වම්පස ඉහල කෙළවරේ **"සුනඛ වන්ධ්‍යාකරණය සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීම"** යනුවෙන් සඳහන් කළ යුතුය.
- සෑම ලංසු අයදුම්පතක්ම 2026.07.31 දින ප.ව. 2.00ට පෙර වීරකැටිය ප්‍රාදේශීය සභා ප්‍රසම්පාදන කමිටු සභාපතිට ලැබෙන සේ ලියාපංදිචි තැපෑලෙන් එවීම හෝ වීරකැටිය ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැකිය.

**<u>ලංසු භාර ගැනීම අවසන් කිරීම හා ලංසු විවෘත කිරීම:</u>**

- 2026.07.31 දින ප.ව. 2.00 ට ලංසු භාර ගැනීම අවසන් කරන අතර එදිනම ප.ව. 2.05 ට ලංසු විවෘත කරනු ලැබේ.
- ලංසු විවෘත කරන අවස්ථාවේ දී ලංසුකරුවට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගී විය හැකිය.

**<u>වැඩිදුර තොරතුරු සඳහා:</u>**

| | | |
|---|---|---|
| දුරකථන අංකය | : | 047 – 2246375 දුරකථන අංකය අමතන්න |
| වෙබ් අඩවිය | : | www.weeraketiya.ps.gov.lk |
| විද්‍යුත් තැපැල් ලිපිනය | : | weeraprasa@gmail.com |